සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

De Mazenod College Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 - (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - (2025)
Year End Evaluation - 2024 - (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .................................................. විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. තමා ඒ සිද්ධිය පිළිබඳ **අබමල් රේණුවක තරම් දෙයක් නොදන්නා** බව සැකකරුවා කිවේ ය.
   1. වැඩි විස්තරයක්  2. කිසිදු තොරතුරක්
   3. අවශ්‍ය ම තොරතුරක්  4. සෑහෙන විස්තරයක්

2. අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම ඔහුගේ **උපන් ගෙයි පුරුද්දක්** බව ගැමියෝ කීහ.
   1. සහජයෙන් එන දෙයක්  2. ලැජ්ජාවෙන් කරන දෙයක්
   3. සිතා මතා කරන දෙයක්  4. උපන් දිනේ දී කරන දෙයක්

3. සමහරුන්ට හැමදේම **හරි හතරැස් විදිහට** අවශ්‍ය වන බව පෙනේ.
   1. සෘජුකෝණාස්‍රයක ස්වරූපයෙන්  2. හතරට බෙදෙන ස්වරූපයෙන්
   3. අංග සම්පූර්ණ ලෙස  4. හතර වරිගයට ගැළපෙන ලෙස

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. මාධ්‍යයේ වගකීම ප්‍රවෘත්තිය පළමුව ඉදිරිපත් කිරීම නො ව .................................. ප්‍රමුඛතාව ලබා දීම යි.
   1. රසවින්දනයට  2. ප්‍රතිනිර්මාණයට  3. නිරවද්‍යතාවට  4. ගවේෂණයට

5. සාහිත්‍යකරුවා ඉදිරිපත් කරන අත්දැකීම හා ඒ සඳහා යොදා ගන්නා බස් වහර අතර .................................. සම්බන්ධතාවක් පවතියි.
   1. අත්‍යන්ත  2. අප්‍රමාණ  3. ආවේණික  4. ආරෝපිත

6. ශේක්ස්පියර්, ඉංග්‍රීසි සාහිත්‍යයෙහි අග්‍රතම කවියා ද දෘශ්‍යකාව්‍ය රචකයා ද හැටියට දැනුදු .................................. පිළිගැනෙයි.
   1. නිරන්තරයෙන්  2. අවිවාදයෙන්  3. අවිචාරයෙන්  4. නිරුත්සාහයෙන්

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
   1. අත්තනගල්ල, අකරවිට, අඹේවෙල, අවිස්සාවේල්ල
   2. රත්මල්දෙනිය, රන්දෙණිගල, රත්මිණිතැන්න, රක්වාන
   3. කඩුගන්නාව, කටගමුව, කලවාන, කඳසුරිඳුගම
   4. ගඩලාදෙණිය, ගන්නෝරුව, ගම්පොළ, ගල්ගමුව

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   1. සැළකිල්ල, ගැටලුව, දිළිසෙන, ඉක්මනින්
   2. කඩතොලු, කනිටු, ගිනිකොන, මන්දාකිනී
   3. සම්මන්ත්‍රනය, ලේඛකත්ව, පුස්තකාලය, කුතිස්සා
   4. කල්‍යාණ, මෙනෙවි, මාංශභක්ෂක, වීරෝදාර

9. එක් එක් වචනයේ දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය හා ගැට ඇලපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   1. සාගින්න, අපූර්ව, ඉගැන්වීම, ප්‍රවෘත්ති
   2. අපූර්ව, සාගින්න, ඉගැන්වීම, ප්‍රවෘත්ති
   3. සාගින්න, අපූර්ව, ප්‍රවෘත්ති, ඉගැන්වීම
   4. ප්‍රවෘත්ති, සාගින්න, ඉගැන්වීම, අපූර්ව

10. 'දේවභාෂිත' යන වචනය අයත් වන්නේ,
   1. අන්‍යාර්ථ සමාසයට ය.
   2. විශේෂණ සමාසයට ය.
   3. විභක්ති සමාසයට ය.
   4. අව්‍යය සමාසයට ය.

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1. සැබරා, ලේඛකයෙක්, නිවේදිකාවක, අසල්වැසියෝ
   2. පූජකයෝ, අපි, වනිතාවක්, ගායකයෙක්
   3. දරුවන්, තරුණිය, ගුරුවරු, මම
   4. සමනලයා, තොප, අතරමැදියෙකු, සේවිකාවක

12. 'සමර්ථ + ය යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   1. සාමර්ථ්‍යය
   2. සමාර්ථ්‍යය
   3. සාමාර්ථ්‍යය
   4. සමර්ථ්‍යය

13. "ගුරුවරු ස්වකීය දරුවන්ට අවවාද දෙති." යන වාක්‍යයේ 'දරුවන්ට' යන්නෙහි විභක්තිය කුමක් ද?
   1. සම්බන්ධ
   2. ආධාර
   3. සම්ප්‍රදාන
   4. කර්ම

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

14. "**බුජ බල** පළ කළ සුරු නර විරු කැල
    යළි හෙළ බිම ඉපදේවා"
   1. ඇතෙකුගේ ශක්තිය
   2. බාහු බලය
   3. අසීමිත බලය
   4. බුද්ධියේ බලය

15. **ස්වාධ්‍යයනයෙහි** ලා ගැඹුරින් නිරත වීම නිසා උන්වහන්සේ භාෂා රසක් ඉගෙන ගත්හ.
   1. තනිව හැසිරීම
   2. ස්වයංක්‍රීය වීම
   3. තමා ම ඉගෙනීම
   4. තමා ම ඉගැන්වීම

16. නූතන සාහිත්‍යකරුවෝ චිරන්තන සාහිත්‍යික **උක්තීන්** භාවිතයට ගනිති.
   1. උක්තයන්
   2. කියමන්
   3. උපකල්පනයන්
   4. ක්‍රියාකාරකම්

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නො වන පදයක් සහිත වරණය තෝරන්න.
   1. තද්ධිත - පෞද්ගලික, පියාණෝ, ඉංගිරිය, ගැමියා
   2. සන්ධි - සමුපකාරය, පොල්ලත්ත, වත්තල, රකිමින්
   3. කෘදන්ත - කියන්නා, නැටීම්, බැලුම්, කැපිලි
   4. විධි ක්‍රියා - අසව, රකිව්, බල, නොකියනු

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

1. ජාලියෝ, හැන්නදිරාල, අලුයම්පොළ, මරක්කලාහේ
2. අනුභූතිය, ප්‍රතිභාව, පරිකල්පනය, සතතාභ්‍යාසය
3. සැහැල්ලුව, කඩුව, දුන්න, හෙල්ල
4. යතුර, මාගල, කුටාලම, දෙබර අත්ත

19. එක් එක් පද පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. ව්‍යක්ත - විදග්ධ, බිරිඳ - පියඹ, ලණුව - රැහැන, ආප්ත - තරුණ
2. මුහුද - අර්ණවය, ආපත්ති - පැමිණීම, පහන - ප්‍රදීප, වැලි - පුලින
3. ස්වර්ණ - කාංචන, සංග්‍රාමය - සටන, රක්ත - ශ්වේත, අසාර - නිසරු
4. ප්‍රහර්ෂය - ආනන්දය, නිදහස - අදීන, දත් - යුගල, පහන් - ප්‍රසන්න

20. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. පාට - පැහැ, වයිති, වර්ණ, පෑ
2. විශාල - විසල්, තුමුල, පෘථුල, මහත්
3. කැලෑව - වල, අටවි, අරණ, පාදප
4. පිපි - පුබුදු, පුල්, මිණිමුතු, පුප්

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නො වන වරණය තෝරන්න.

1. කනිෂ්ඨ - ජ්‍යෙෂ්ඨ 2. සුදන - දුර්ජන 3. ප්‍රාචීන - ප්‍රතිචීන 4. විරල - සරල

22. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?

1. වැසි වසිද්දී ගොවියෝ සතුටට පත් වූහ.
2. අම්මා ගී ගයමින් දරුවා නළවයි.
3. පාඩම් කළොත් විභාගය සමත්විය හැකි බව ගුරුතුමී කීවා ය.
4. නංගී ගෙදර පැමිණ දුකෙන් හැඬුවා ය.

23. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

1. රකාරාංශය ව්‍යඤ්ජනයකට පරව බැඳෙන 'ර්' වෙනුවට යෙදේ.
2. 'ඥ' යනු ජ්+ඤ අකුරු දෙක සම්මිශ්‍රණයෙන් සෑදුණු බැඳි අකුරකි.
3. අතීත කාල ක්‍රියා රූපවල 'ර' කාරය 'ළ' බවට පත් වේ.
4. ප්‍රථමා සිට ආලපන දක්වා විභක්තීන්ට අයත් පදයක් මුලින් යෙදී සිදු වන සමාසය විභක්ති සමාසය නම් වේ.

24. ඕෂ්ඨජ අක්ෂර පමණක් අන්තර්ගත වචනය තෝරන්න.

1. උපමා 2. පඹයා 3. බඹරා 4. පමණ

25. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථ නාමය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

1. කා ක ම ර යො රු 2. ය ව හෙ රු යි ම් මා 3. ච බා ගි ඩ නි ත් න 4. ච නැ හෙ ල් ල ට

- අංක 26 සිට 27 ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

26. කපන්න බැරි අත ඉඹින්නා වගේ

1. කපා දැමීමට බැරි අත්ත විනාශ කිරීමට සැලසුම් කිරීම
2. පළිගැනීමට නොහැකි වූ විට හිතවත්ව කටයුතු කිරීම
3. දැඩි හිතවත්කම් පෙන්වන්නට ගොස් සතුරු කම් කිරීම
4. යමෙකුගේ අතක් සම්පූර්ණයෙන් ම කපා දමා දුකෙන් සිප ගැනීම

27. ඔංචිල්ලාව එහාට ගියත් මෙහාට එනවලු

1. ඔංචිල්ලාව නිතර පැද්දෙන බැවින් ප්‍රවේසම් විය යුතු බව
2. අරමුණකින් තොරව වැඩක් කිරීමේ නිෂ්ඵල බව
3. ඕනෑ ම ක්‍රියාවකට යම් ප්‍රතික්‍රියාවක් ද ඇති බව
4. උදව්වක් කර නැවත යමක් බලාපොරොත්තු වීම

28. A - කාලෝචිත - ස්වරාදේශ සන්ධිය B - වල්ලම්බලම - පරරූප සන්ධිය
C - උනුන් - ස්වර සන්ධිය D - ශාලාධිපති - පූර්ව ස්වරලෝප සන්ධිය
A, B, C, D යෙදුම් අතුරෙන් නිවැරදි වන්නේ,
1. A හා B පමණි. 2. B හා C පමණි. 3. C හා D පමණි. 4. A හා C පමණි.

- අංක 29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

29. 1. සියලු ක්‍රීඩා විචාරකයෝ පැමිණ ඇත.
2. අපේක්ෂකයෝ හා නියෝජිතයන් රැස්වීමට ආහ.
3. දරුවන් කැටුව දෙමව්පියෝ නේවාසිකාගාරයෙන් නික්ම ගියහ.
4. ඔහු පූජකයෙක් වැනි ය.

30. 1. යාචකයන් සැණකෙළි බිමට පැමිණෙති' යි සංවිධායකයෝ බිය වූහ.
2. ඔවුහු ප්‍රතිවාදීන් නොවෙති.
3. සියලු නායකයෝ සත්‍යගරුක විය යුතු ය.
4. කිසිවෙක් පිළිතුරු නොදෙන්නේ ඇයි?

31. A - සාහිත්‍ය නිර්මාණ අතුරෙන් කවිය ................................ කාව්‍යට විශේෂ ස්ථානයක් හිමි වේ.
B - නව ඖෂධ ප්‍රතිපත්තිය ................................ රුපියල් ලක්ෂ හැටක විදේශ විනිමයක් ඉතිරි කිරීමට ලංකාවට හැකි විය.
C - සියලු දෙනාගේ යහපත ................................ විහාරමහා දේවිය මුහුදට බිලි වූවා ය.
D - මහල්ලා කිරි දරුවෙකු ................................ හඬා වැටුණේ ය.
E - මෙන්, F - උදෙසා, G - හෙවත්, H - නිසා
1. G, H, F, E 2. H, G, E, F 3. G, H, E, F 4. H, E, G, F

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''මං තේරුං කරන්නට මහන්සි ගත්තා''
1. මම මහන්සි වී තේරුම් ගැනීමට පටන් ගත්තෙමි.
2. මම මහන්සියෙන් තේරුම් කළෙමි.
3. මම තේරුම් කර දීමට උත්සාහ දැරුවෙමි.
4. මම තේරුම් කර දුන්නේ මහන්සියෙනි.

33. ''සුදු කොඩි'' කෙටිකතා සංග්‍රහය,
1. ගුණදාස අමරසේකරගේ ය. 2. මහගම සේකරගේ ය.
3. විමල් දිසානායකගේ ය. 4. ඇරව්වල නන්දිමිත්‍රගේ ය.

34. පහත දැක්වෙන පද්‍ය කොටසේ වඩාත් කැපී පෙනෙන කාව්‍යාලංකාරය වන්නේ,

කතා බහෙන් සිනාසෙමින්
ජීවිතයේ ගිරිදුර්ගය
නගින
සොඳුරු ගැහැනිය ඔබ.

1. උපමා 2. රූපක 3. එළිසමය 4. ස්වභාවෝක්තිය

35. ''නර මුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ'' යන පද්‍ය පදයේ ''නරමුල්'' යන්නෙහි අර්ථය වන්නේ,
1. මිනිසාගේ මුල 2. නහර පැදුණු සම
3. අපාය දුක 4. පැසුණු කෙස්

№ 063128

36. පහත සඳහන් කවියේ තුන්වෙනි පදය තෝරන්න.

බලි තරු රාවණ ගැමුණු විජයබා නිරිඳුන් ලද ලංකා
පුලතිසි දැම් සිරි රහල් කුමරතුඟු පඬුවන් ලද ලංකා
..........................................................................
ඔබ රැකුණොත් ලෝකුඹුව ද අපහට සීත ගඟුලි ලංකා

1. හෙළ මුතු මිණි වැල් එකට දමා ලා ඔබ සරසමු ලංකා
2. ගොඩ දිය අහසේ හැම තැන ඔබගේ නම කියවමු ලංකා
3. විදු සක්විති මහ පැරකුම් කිවිසුරු කිවියන් ලද ලංකා
4. සමනොළ කිරිගල් පිදුරුතලා ඇ කෙහෙ ගැට බැඳි ලංකා

Learning Resource Center
R
De Mazenod College
Kandana

37. "දෙයක් වේ නම් යම්
සුදුස්සාට ම අයිති විය යුතු" යන අදහස දෙමින් රචිත නාට්‍යය කුමක් ද?

1. තල මල පිපිලා 2. සිංහබාහු 3. ගුරු තරුව 4. හුණුවටයේ කතාව

38. පතල් කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'සන්නම්' යනු

1. වටිනා ගල් 2. නො වටිනා ගල් 3. වර්ණවත් ගල් 4. අවපැහැ ගල්

39. "වනත් නොයෙක් ගං හෝ ඇළ කඳුරු පැන
මහත් ගැඹුරු සිඳු නො යනේ'වී වෙරළ පැන
ලදත් මෙමුළු දඹදිව රජ සිරි සුදන
සිරිත් ලෙසට පවතී උඩඟු නොවමින"

යන කවියෙන් කියැවෙන්නේ,

1. සුදන ගුණ ගැන ය. 2. මුහුදු වෙරළක් ගැන ය.
3. දඹදිව ගැන ය. 4. උඩඟුකම පිළිබඳව ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"රූඩී හෙවත් ඉඟි වැකි මගින් පළ වනුයේ වාච්‍යාර්ථය මත ආරෝපණය වූ අමුතුම අරුතකි. කතා කිරීමේ දී මෙන් ම ලිවීමේ දී අදහස් රසවත්ව හා සිත් ගන්නා සේ ඉදිරිපත් කිරීමට මේ යෙදුම් උදවු වේ".

1. වාච්‍යාර්ථය මත ආරෝපණය වූ වෙනත් අර්ථයක් ප්‍රකාශ කරන රූඩී හා ඉඟි වැකි කියවීමේ දී ත් ලිවීමේ දී ත් වැදගත් වේ.
2. වචනයේ මතුපිට අර්ථය මත ආරෝපණය වූ අමුතු අර්ථයක් පළ කරන රූඩී හෙවත් ඉඟි වැකි චිත්තාකර්ෂණීය හා රසවත් ලෙසත් අදහස් ප්‍රකාශනයට උපකාරී වේ.
3. රූඩී හෙවත් ඉඟි වැකි වචනයේ මතුපිට අර්ථය මත ආරෝපණය වූ වෙනස් අර්ථයක් පළ කරමින් රසවත් ලේඛනයට උපකාරී වේ.
4. වාච්‍යාර්ථය මත ආරෝපණය වූ වෙනස් අර්ථයක් පළ කරන රූඩී හා ඉඟි වැකි භාෂාව රසවත්ව හා චිත්තාකර්ෂණීය ලෙස කථනයට උදව් වේ.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre R 53128 (Dr. Mazenod ... Kand...)

වර්ෂ අවසාන ඇගයීම - 2024 - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - 2025
Year End Evaluation - 2024 - 2025

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

(i) ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. i. සිට x. තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

 i. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් අනුනාසික අක්ෂර යෙදුණු වචන දෙකක් ලියන්න.
 **භාණ්ඩ ප්‍රවාහනය සඳහා අතීතයේ දී ජල මාර්ග යොදා ගැනිණි.**

 ii. පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදාස් කර ලියන්න.
 **එක් කරුණක් අරභයා දැක්විය යුතු සියල්ල සම්පිණ්ඩනය කොට සීමාසහිත දිග ප්‍රමාණයකින් යුතුව පිළිවෙලකට සකස් කල ගද්‍ය නිබන්ධය වාක්‍ය රචනයකි.**

 iii. පහත දැක්වෙන පදවල ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.
 (අ.) ඇඳිරි (ආ.) ලාංකේය

 iv. පහත සඳහන් පද නිවැරදිව විසන්ධි කර ලියන්න.
 (අ.) දැඟිලි (ආ.) තුනුවග

 v. පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
 (අ.) බොහෝ කලක සිට පැවත එන (ආ.) අලුතින් යමක් සෙවීම

 vi. පහත සඳහන් යෙදුම්වල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.
 (අ.) පුරඹර **වසමින්** සිටි රඟ කුම් වැනි (ආ.) නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු **කොට**

 vii. පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
 (අ.) නිශ්‍රීක (ආ.) වියෝග

 viii. පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
 (අ.) පදිකයෝ මාර්ග නීති පිළිපදිති'යි පොලිස් නිලධාරීහු සිතුහ.
 (ආ.) ඕ තොමෝ පූජාභාණ්ඩ අතැතිව වතාවත්වල යෙදෙති.

 ix. පහත වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පද අයත් වන විභක්ති වර්ගය නම් කරන්න.
 (අ.) **දරුවන්ගේ** ඉදිරිපත් වීම අගය කළ යුතු වේ.
 (ආ.) වෛද්‍යවරු **දරුවන් කෙරෙහි** වැඩි අවධානයක් යොමු කරති.

 x. පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
 (අ.) නිවැසියෝ ආගන්තුකයින් ආදරයෙන් පිළිගනිති.
 (ආ.) පෙර රජවරු රට සහලින් සවයංපෝෂිත කළහ. (ල. 2×10=20)

2. පහත දැක්වෙන (අ.), (ආ.), (ඇ), (ඈ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ.) රටක ප්‍රවාහන පද්ධතිය සෑම පුරවැසියෙකුගේ ම අවශ්‍යතාවකි. වර්තමානයේ අප රටේ පවත්නා ගමනා ගමන ක්‍රම පිළිබඳව විවිධ චෝදනා අසන්නට ලැබේ. මේ සඳහා වැඩි වශයෙන් රියදුරන්ගේ හා පදිකයන්ගේ ක්‍රියාකලාප හේතු වී ඇති බව පෙනේ. මෙහි දී සිදුවන හානි මිනිය නොහැකි වන අතර මේ සඳහා විසඳුම් සෙවීමේ දී සියලු පාර්ශ්ව එකතු වී කටයුතු කිරීම අවශ්‍ය වේ.

(ආ.) ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් වූ ශ්‍රී ලංකාව සුන්දර වෙරළ තීරයකින් වට වී ඇත. දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත් ඇදගත් මේ වෙරළ තීරයේ ආකර්ෂණය ගිලිහී යාමට ඇතැම් මිනිස් ක්‍රියාකාරකම් හේතු වී ඇත. වෙරළේ සුන්දරත්වය තව දුරටත් වර්ධනය කර ගැනීමෙන් අපට බොහෝ ප්‍රතිඵල ලබා ගත හැකි වේ.

(ඇ.) අද මුළු ලොව ම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත. ඒ සඳහා මූලික වශයෙන් ම තොරතුරු තාක්ෂණය සන්නිවේදනය වැනි කරුණු බලපා තිබේ. සාමකාමී හා සහජීවනයෙන් යුතු නව ලොවක් නිර්මාණය කිරීමට මෙම ප්‍රවණතාවන් යොදා ගත හැකි වේ. ඒ සඳහා ලෝ වැසි සියල්ලන්ගේ අවධානය යොමු විය යුතු වේ.

(ඈ.) වර්තමානයේ බොහෝ දෙනා කසළ අවිධිමත් ලෙස පරිසරයට මුදා හරිති. එයින් සිදුවන පාරිසරික හානිය සුළුපටු නොවේ. මුළු ලොව ම කසළ ප්‍රතිචක්‍රීකරණයෙන් විපුල ඵල ලබා ගන්නා බව නොරහසකි. කසළ සම්පතක් කර ගනිමින් ප්‍රතිලාභ ලබා ගැනීමට අප ද කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. (ලකුණු 25)

3. පහත දැක්වෙන පාඨය වචන 60 -70 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

සාහිත්‍යකරුවා ලෝකයෙහි, සමාජයෙහි තමාට දක්නට ලැබෙන දේ දෙස බලන්නේ සාමාන්‍ය ජනයා එය දකින ආකාරයෙන් නොව අපූරු දෑසකිනි. එහි සුන්දර මෙන් ම අසුන්දර යැයි සැලකෙන දේවල් තුළින් ද ඔහු රසයක් ලබයි. ඇතැම් සාහිත්‍ය රචනා කියවන කලත් කියවනු ඇසෙන විටත් අමුතු ම ප්‍රියජනක හැඟීමක් උප දී. ශබ්දය නිසා ඇතිවන්නා වූ ඒ ප්‍රියජනක හැඟීම අනුව දැනෙන ආස්වාදය, ශබ්ද රසය නමින් හැඳින්වෙයි. ශබ්ද රසය ගද්‍ය පද්‍ය දෙකෙහි ම දක්නට ලැබේ. නිර්මාණයෙහි දක්ෂ ලේඛකයා ශබ්දය කෙරෙහි පමණක් නොව අර්ථය කෙරෙහි ද තම සිත යොමු කරයි. ඔහු අර්ථවත් වචන අර්ථවත් ලෙස යොදා ගනිමින් අර්ථවත් අදහස් සමුදායක් ප්‍රකාශ කරයි. සාහිත්‍ය රචනා කියවන කල අපට පළමුවෙන් ම දැනෙන්නේ ඉන් නැගෙන හඬ අනුව ඇතිවන ශබ්ද රසයයි. අර්ථ රසය දැනෙන්නේ ඉන් අනතුරුව ය. ශබ්ද රසය විඳීමෙහි ලා ප්‍රධාන වශයෙන් කන උපකාරී වන අතර අර්ථය විෂය වන්නේ මනසට යි. හුදෙක් ශබ්ද රසයට මුල් තැන දී කරනු ලබන නිර්මාණ සාහිත්‍ය වටිනාකම අතින් පහත් තත්ත්වයෙහි ලා සැලකේ. එය පෝෂ්‍ය ගුණයෙන් හීන වූ ආහාරයක් වැන්න. ශබ්ද රසය ගද්‍ය පද්‍ය දෙකට ම පොදු වුව ද එය වැඩි වශයෙන් පද්‍යයෙහි දක්නට ලැබේ. උචිත වෘත්තය, එළිසමය, රිද්මය, භාවපූර්ණ අනුප්‍රාසාත්මක හා අකුරු භාවිත කිරීම ආදී අංග ශබ්ද රසය වඩාත් තියුණු කිරීමෙහි උපකාරී වන බව පිළි ගැනේ.

(ලකුණු 25)

4. පහත දැක්වෙන උද්ධෘතය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ලංකා ඉතිහාසය හදාරන්නන්ට නිවැරදි තොරතුරු දැන ගැනීමේ මූලාශ්‍රයක් වශයෙන් ලංකාවේ සිද්ධීන් ඇතුළත් විත්ති පොත් ද පළාත් සීමා විස්තර ඇතුළත් කඩඉම් පොත් ද බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. වයඹ හා උතුරු, මධ්‍යම පළාත්වල ගම්වල මෙම පුස්කොළ පොත් තම මුතුන් මිත්තන් විසින් නතු කොට ගෙන සිටි ධනයේ හා ඉඩකඩම්වල පාරම්පරික උරුමකරුවෝ වූ සමහර පුද්ගලයන් සහ පවුල් තවමත් ආරක්ෂා කර ගෙන සිටිති. මින් සමහරක් කොළඹ කෞතුකාගාර පුස්තකාලය විසින් ලබා ගෙන ආරක්ෂා කර ඇත. බැවහර සිංහලයෙන් ලියා වී ඇති මේ පොත්වල අමාත්‍යවරුන්, සෙබළුන් හෝ ශිල්පීන් වශයෙන් රාජකාරි කළ ජනනායකයින්ගේ හා ප්‍රභූන්ගේ පරම්පරාගත විස්තර සඳහන් ව ඇත. ලංකාව බෙදා වෙන් කොට තිබූ පළාත් හා දිස්ත්‍රික්ක, ඒවායේ නගර හා ගම් ද එම බෙදීම්වල මූලාරම්භය ද කඩඉම් පොත්වල සඳහන්ව ඇත. මේ පුස්කොළ පොත් අතර විශේෂත්වයක් දරන කිහිපයක් නම් කුරුණෑගල විස්තරය, අෂ්ටවිසෙකි රට, මදුරාපුරෙනාවිත්තිය, පඬුවස් නුවර වරරාජ ගෝත්‍රය, මනුරාජ වංශය ආදිය යි. කොළඹ කෞතුකාගාර පුස්තකාලය සතු අගනා පුස්කොළ පොතකි; විනය පිටකයට අයත් චුල්ලවග්ග

පාලියේ අත් පිටපත. මෙය දහතුන් වැනි සියවසේ දී ලියන ලද්දකි. දැනට ලංකාවේ පුස්කොළ පොත් අතරින් පැරණිතම යැයි සැලකෙන මෙම අත් පිටපතේ එන ඇතැම් සිංහල අක්ෂරවල විපරිණාමය ගැන ආචාර්ය පරණවිතාන අදහස් දක්වා ඇත.

i. ලංකා ඉතිහාසය හැදෑරීමේ දී ලංකාවේ සිද්ධීන් හා සීමා විස්තර ඇතුළත් පොත් මොනවා ද?

ii. පුස්කොළ පොත් තවමත් ආරක්ෂා කරගෙන ඇත්තේ කවුරුන් විසින් ද?

iii. මේ පුස්කොළ පොත්වල සඳහන් ව ඇති එක් කරුණක් දක්වන්න.

iv. පුස්කොළ පොත් අතර විශේෂත්වයක් දරන කෘති හතරක් ලියන්න.

v. චුල්ලවග්ගපාලියේ අත්පිටපත පිළිබඳ පාඨයේ සඳහන් වැදගත් කරුණු දෙකක් ලියන්න.

(ල. 2+5=10)

5. දියලුව ජයසෙන් පුර ප්‍රදේශයේ ජීවත්වන සම්මාන ලාභී ලේඛක සනත් ගුණසීල මහතා විසින් නිර්මාණය කරන ලද නවතම කාව්‍ය සංග්‍රහය "තුටු සිත" කෘතිය එළි දැක්වීම ඉදිරි දිනයක දී ජයසෙන්පුර ප්‍රජාශාලාවේ දී සිදු කිරීමට නියමිත ය. ප්‍රදේශයේ එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය මගින් සංවිධානය කරණු ලබන මෙම උත්සව අවස්ථාවට සහභාගි වන මෙන් දන්වා යැවීමට සුදුසු ඇරාධනා පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්

පහත දැක්වෙන්නේ පසුගිය දා පැවති උත්සවයක් පිළිබඳව පුවත් පත් වාර්තාකරුවෙකුගේ දළ සටහනකි. ඒ ඇසුරෙන් පුවත්පතකට සුදුසු වාර්තාවක් සකස් කරන්න. (වචන 100 ක් පමණ සෑහේ.)

| | |
|---|---|
| අරමුණ | - සුළු අපනයන බෝග වගාකරුවන්ට සම්මාන ප්‍රදානය සඳහා |
| සහභාගිත්වය | - ජයග්‍රාහකයන්, ප්‍රදේශවාසීන් හා ආරාධිතයන් |
| ප්‍රධානත්වය | - පළාත් කෘෂිකර්ම ඇමතිතුමා |
| මෙහෙයවීම | - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| ස්ථානය | - ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය |

(ල. 15 යි.)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre R De Mazenod College Kandana 63128

වර්ෂ අවසාන ඇගයීම - 2024 - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - 2025
Year End Evaluation - 2024 - 2025

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | III | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශනවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 යි.

---

1) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "සටනෙකැයි සිතක් නො තබා භය නො ගෙන සුව සේ රාජ්‍ය ශ්‍රී අනුභව කළ මැනැව යි "

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මේ කොටස උපුටා ගත් ග්‍රන්ථය ට මූලාශ්‍රය වූ ග්‍රන්ථය කුමක් ද?

ii. ............................................................

............................................................

පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලත් නැතේ

මෙම කවියේ මුල් පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

iii. "කරුණු වශයෙන් ඒවා සලකා ගැනීමට ඇගේ පටල සහිත මොළය ශක්තිමත් වුයේ නැති....."

(අ) මෙහි ඇගේ යනුවෙන් හැඳින්වූයේ කවරෙක් ද ?

(ආ) මේ ප්‍රකාශය අන්තර්ගත කෘතියේ අනුවර්තකයා කවරෙක් ද?

iv. " දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට ......"

(අ) මේ කවි දෙපදයෙන් ප්‍රකාශ වන වෙහෙර කුමක් ද?

(ආ) මෙහි අන්තර්ගත උපමාව උපුටා දක්වන්න

v. " මිනිහට තරහ ගිය පාර එවෙලේ ම නඩු දාන්ඩ නම ලියාගෙන ගියාලු...."

(අ) මෙහි නඩු දාන්න යයි පවසන සිද්ධිය කුමක් ද?

(ආ) මේ ප්‍රකාශය අන්තර්ගත මුල් කෘතිය කුමක්ද ?

vi. " දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ...."

(අ) මේ ගීත කණ්ඩයේ ඇති රූපකාර්ථයක් උපුටා දක්වන්න.

(ආ) මෙම ගී කණ්ඩය උපුටාගත් කාව්‍ය සංග්‍රහයේ නම කුමක් ද?

vii. " ඕකත් වැඩක් යැ අනේ අරන් යන්නකො ඉතින් "

(අ) මෙහි අරන් යන්න යැයි පවසන්නේ කුමක් ද?

(ආ) මෙම කොටස උපුටා ගත් කතාවේ කතුවරයා නම් කරන්න

viii. (අ) සාමණේර භික්ෂූන් සඳහා සම්පාදිත විනය නීති සංග්‍රහය නම් කරන්න.

(ආ) ගම්පොළ යුගයේ ලියවුණු සන්දේශ කාව්‍යයක් නම් කරන්න.

ix. ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු
තමන්ගේ තරම දැනගෙන කල් අරිනු

(අ) මෙම කවියේ ඇතුළත් ශබ්දාලංකාර දෙකක් නම් කරන්න

(ආ) අවසාන කවි පදයෙන් කියවෙන ආප්තෝපදේශය කුමක් ද?

x. කවදා කොතනකදි හෝ මහ මුහුද හිමි
හමුවුණු කෙනෙහි මා සතු බර ඔහුට දෙමි

(අ) මේ කවියේ අන්තර්ගත රූපකාර්ථවත් යෙදුම උපුටා දක්වන්න.

(ආ) කවි පද දෙකෙහි අදහස කෙටියෙන් දක්වන්න. (ලකුණු 02 x 10 = 20 යි)

(2) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

i. "හවුරුද්දකින් <u>සමසෙකින්</u> අරුමයක් සේ <u>පානා කෙළි</u> බුදුන් අවුත් මෙ තැනට සම්භව ඔබම අමුතු ව පහළ වූවා සේ....."

(අ) මෙහි කියවෙන පරිදි බුදුන් වහන්සේ මෙතැනට පැමිණෙද්දී සිදුවූ සිදුවීම කුමක් ද?

(ආ) මෙහි අංකිත පදවලට අරුත් සපයන්න.

ii. පියතුමගෙ රුදු තුමුල
බාහු යුවළින් ම මිස
බැරිය සොලවන්ට එය
යන්ට නොසිතන්න මා
සොහොයුරනි, පෙම්බරා

(අ)මෙහි කියවෙන්නේ සිංහයා පිළිබඳ ව ඇති කුමන සිතුවිල්ලක් ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද වල අර්ථ ලියන්න.

iii. "මිනිස්සු මහතෙරුන් නො බා එළැඹියටි වෙති. එකල්හි අහරින් ක්ලාන්ත නො වැ මහණුවම් කරන්නට නිසි වෙත්."

(අ) මෙම කොටසින් කියවෙන අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

(ආ) මේ කොටස ලිහිල් බසින් ලියන්න.

iv. යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
අහසින් බැස රග ගත් රග කෙළෙසී
දිසිමෙන් විය විදුලිය සිය දහසී

(අ) මේ කවියෙන් කියවෙන උපමා උපමේයක් වෙන් කොට දක්වන්න.

(ආ) මෙහි කියවෙන පරිදි ජනයාගේ සිත් මත් වූයේ කෙසේදැයි කෙටියෙන් දක්වන්න.

v. මග නිලමින් සිටි නා දොඹ නී පියළ
පිය සලමින් මලගෙහි කෙළැ රොනින්වල
තුතුඩලමින් බිඳු විලිකුන් මියුරු පළ
ඉසිඹුලමින් යෙහි සැළ දඹ පඳුරුවල

(අ) මෙහි සඳහන් මාර්ගය නිල් පැහැ ගන්වමින් ඇති ගස් වර්ග නම් කරන්න
(ආ) සැළලිහිණියාට මේ ස්ථානයේ දී සිදුකරන්නට යැයි පවසන ක්‍රියාවන් විස්තර කර ඇත්තේ කෙසේ ද? (ලකුණු 04 x 5 = 20 යි)

(3) ගුරුළුගෝමී පඬිවරයා අමාවතුර, ග්‍රන්ථයෙහි

- අංගුලිමාල සොරාගේ චරිතය
- අංගුලිමාල තෙරුන්ගේ චරිතය

මහජනයාගේ ජීවිත වලට වෙනස් ලෙස බලපෑ අන්දම අඟුල්මල් දමනය ඇසුරින් උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න. (ලකුණු 15 යි)

නැතහොත්

- අවස්ථා සිද්ධි නිරූපණයේ දී ඓතිහාසික සමාජීය, ආර්ථික තොරතුරු යොදා ගැනීමත්
- කාව්‍යාලංකාර මගින් රසවත් වීමත් නිසා සැළලිහිණි සංදේශය විශිෂ්ඨ නිර්මාණයක් විය.

"මග වැනුමෙන්" එක කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(4) පාරිසරික වශයෙන් වෙනස් වීමට ලක් වූ ගම්මානයක

- සජීවී නිරූපණය
- භාෂාව මගින් රසවත් වීම

බැද්දේගම නවකතාව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පෙන්වා දෙන්න.

නැතහොත්

"වස්සානය" පද්‍ය පන්තියෙන් පෙන්වා දෙන

- ජීවන දෘෂ්ටිය
- මනරම් පරිසරය

කාව්‍යෝක්ති ඇසුරින් උචිත පරිදි නිර්මාණය වූ අයුරු එක් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

5,6,7 යන ප්‍රශ්න වලින් එකකට පමණක් උත්තර ලියන්න.

(5) කුරහන් ගොවියාගේ අභියෝග ඉදිරිපත් කිරීමේ දී, ධ්වනිතාර්ථවත් යෙදුම් භාවිත කිරීම නිසා කවි පන්තිය සාර්ථක වී ඇති අයුරු "කුරහන් ඉසිමුව කළුවර බලාලා" යන කවි පෙළෙ ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

(6) බිරිඳගේ හැඟීම් තේරුම් ගෙන ඇයට පිළිසරණක් වූ යහපත් සැමියෙකු ලොයිසල් ගේ චරිතයෙන් කතුවරයා මතු කර ඇති අයුරු "දියමන්ති මාලය" කෙටිකතාව ඇසුරෙන් උදාහරණ තුනක්වත් ගෙන විස්තර කරන්න. (ලකුණු 10 යි)

(7) අජීවී පරිසරයකට ජීවී බවක් එක් කරමින් ගලායන ගංගාවක් රසවත් අත්දැකීමකට පාදක කරගත් ආකාරය "ගංගාවේ සංගීතය" පැදි පෙළෙන් උචිත උදාහරණ තුනක් වත් ගෙන විමසන්න. (ලකුණු 10 යි)